# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2006/17 - 2017 පෙබරවාරි මස 14 වැනි අඟහරුවාදා - 2017.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මාතර IV වන අදියර ජල සම්පාදන ක්‍රමය යටතේ තුළුමං ළිඳ හා පොම්පාගාරය ඉදිකරන ඉඩමට පිවිසෙන මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 පෙබරවාරි මස 01 වැනි දින,<br>
අංක 35, "ලක්දිය මැදුර",<br>
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/2/1253.

#### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 350 A කටුවන්ගොඩ ග්‍රාම නිලධාරි වසමේ කටුවන්ගොඩ ගමේ පිහිටි අරලුගහ කොරටුව නමැති ඉඩමෙන් පර්චස් 01 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | ගඟ දෙසට යන බොරළු පාර ; |
| *දකුණට* | : | ගඟ දෙසට යන බොරළු පාර ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් :*

01. ඩබ්. ඒ. කේ. සරත්චන්ද්‍ර මහතා,<br>
ගෙමැට්ටිගේ වත්ත, කටුවන්ගොඩ,<br>
පාලටුව.

02. නාලනී හතරසිංහ මිය,<br>
අරලුගහ කොරටුව,<br>
කටුවන්ගොඩ, පාලටුව.

03 - 40

1A - G 25130 — 18 (2017/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*